**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>ඉන්දියානු ජාතික ශ්‍යාමලා ගෝලි පිහිනුම් ශූරිය පෝක් සමුද්‍ර සන්ධිය තරණය කිරීමට සූදානමින්</u>**

උතුරු පළාත් සභාවේ සභාපති ගරු සී. වේලුපිල්ලේ කන්දයියා සිවඥානම් මැතිතුමා ඉන්දියාවේ ශ්‍යාමලා ගෝලි පිහිනුම් ශූරිය විසින් කිලෝ මීටර 30ක පෝක් සමුද්‍ර සන්ධිය තරණය කිරීමේ සුවිශේෂී අවස්ථාවේ ආරම්භය නිල වශයෙන් සනිටුහන් කළේය. ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ජනතාව අතර ශතවර්ෂ ගණනාවක් පැරණි මිත්‍රත්වය හරහා ගොඩනැගී සමීප සබඳතා මෙම ප්‍රයත්නයෙන් සංකේතවත් කෙරේ.

2021 මාර්තු 19 වන දින ශ්‍රී ලංකාවේ තලෙයි මන්නාරමේ සිට ඉන්දියාවේ ධනුෂ්කොඩි දක්වා පෝක් සමුද්‍ර සන්ධිය තරණය කිරීමට උත්සහ දරන 47 හැවිරිදි මෙම ප්‍රවීණ පිහිනුම් ශූරිය එම අභියෝගය ජය ගන්නා ලොව දෙවන කාන්තාව සහ ලොව 13 වන පුද්ගලයා වනු ඇත.

ශ්‍යාමලා ගෝලි මහත්මිය 2020 වසරේදී දකුණු කොරියාවේ ග්වාන්ජු හි පැවති FINA ලෝක ශූරතා පිහිනුම් තරඟාවලිය සඳහා තෙලංගනා ප්‍රාන්තය නියෝජනය කරමින් සහභාගී විය. 2020 නොවැම්බර් මාසයේදී ඇය පට්නා හි මහා ගංගා නදියේ කිලෝ මීටර් 30ක් පිහිනූ අතර එහිදී මිනිත්තු 110ක කාලයක් සටහන් කරමින් හය වන ස්ථානය හිමි කර ගත්තාය.

විවිධ කුසලතාවයන්ගෙන් සපිරි ශ්‍යාමලා මහත්මිය සජීවීකරණ චිත්‍රපට නිෂ්පාදිකාවක්, අධ්‍යක්ෂවරියක් සහ ලේඛිකාවක් ද වේ. ඇය පිහිනුම් ක්ෂේත්‍රයට අවතීර්ණ වූයේ වසර හතරකට පෙර වීම විශේෂත්වයකි. ඇය හයිඩ්‍රාබාද් හි ගච්බොව්ලි SATS පිහිනුම් තටාකයේ ඇයගේ පුහුණුකරු වන ආයුෂ් යාදව් මහතාගේ උපදේශකත්වය යටතේ පෝක් සමුද්‍ර සන්ධිය තරණය කිරීමට සූදානම් විය. ඇය විසින් පෝක් සමුද්‍ර සන්ධිය තරණය කිරීම සමස්ත කාන්තා පරපුරෙහිම ජයග්‍රහණයක් වනු ඇතැයි ශ්‍යාමලා මහත්මිය තරයේ විශ්වාස කරයි. එසේම, එය කාන්තාවන්ට ඉහළ ඉලක්කයන් හඹා යාමට ද කළ නොහැකි කිසිවක් නොමැති බව විශ්වාස කිරීමට ද උත්ප්‍රේරකයක් වනු ඇතැයි ඇය විශ්වාස කරයි.

***

කොළඹ
2021 මාර්තු 18